නිපුණතාවය - 12 නව යෞවන අවධිය

01) පුද්ගලයෙකුගේ ජීවන චක්‍රය තුළ වැදගත් සන්ධිස්ථානයක් ලෙස "යොවුන්විය" සැලකිය හැකිය.
ලෝක සෞඛ්‍යය සංවිධානයේ අනුමැතියට අනුව යොවුන්වියට අයත් වයස් කාලසීමාව නම් කරන්න.

02) "යොවුන්විය" වයස් සීමා අනුව වෙන් කර දක්වා ඇත. හඳුන්වන්න.

03) මුල් යොවුන්විය තුළ පිළිබිඹු කරන (ගැහැණු හා පිරිමි ළමුන්ගේ) විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

04) ස්ත්‍රී ලිංගික හෝමෝන දෙකක් හා පුරුෂ ලිංගික හෝමෝන එකක් නම් කරන්න.

05) ද්විතීක ලිංගික ලක්ෂණ ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවයටම පොදු ලක්ෂණ ද ඇත. එවැනි ලක්ෂණ වලට උදාහරණ 4ක් දක්වන්න.

06) යොවුන්වියේ චිත්තවේග ප්‍රකාශනයෙහි ස්වභාවයන් දෙක සඳහන් කරන්න.

07) "සම වයස් ඇසුර" නව යෞවනයකුගේ හැසිරීම් රටාව කෙරෙහි ඵලදායී ලෙස ක්‍රියාකාරී වන අවස්ථා 3ක් සඳහා උදාහරණ සපයන්න.

08) "දුස්සමාහිත" බව හඳුන්වන්න.

09) "මානසික වර්ධනය" යන්න හඳුන්වා මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ හතරක් සඳහා උදාහරණ දක්වන්න.

10) යොවුන් අවශ්‍යතා හොඳින් අවබෝධ කරගෙන යෞවනයා සමාජානුයෝගී පුද්ගලයෙකු කිරීමට වැඩිහිටියන්ට ගත හැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න.